සභාපති / தலைவர் / Chairman — 011 2572271 කාර්යාලය / காரியாலயம் / Office; 011 2532695, 011 5748338 නිවස / இருப்பிடம் / Residence; 011 2534901 ෆැක්ස් / பெக்ஸ் / Fax

උප සභාපති / உபதலைவர் / Vice Chairman — 011 2572276 කාර්යාලය / காரியாலயம் / Office; 071 4288994 නිවස / இருப்பிடம் / Residence

kolonnawauc123@gmail.com ඊ-මේල් / மின்அஞ்சல் / E-mail

# කොළොන්නාව නගර සභාව
# கொலன்னாவ நகர சபை
# Urban Council Kolonnawa

කොළොන්නාව, වැල්ලම්පිටිය.
கொலன்னாவ வெல்லம்பிட்டிய
KOLONNAWA, WELLAMPITIYA

න. ස.කාර්යාලය / ந.ச. காரியாலயம் / U. C. Office — 011 2572329

ලේකම් / காரியதரிசி / Secretary — දු.ක. / தொ.பே / Tel: 011 2572277; ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2532303

ගණකාධිකාරී / கணக்காளர் / Accountant — 011 2534732


| මගේ අංකය : / எனது எண் / My No. | ඔබේ අංකය : / உமது எண் : / Your No : | දිනය : / திகதி : / Date : |
|---|---|---|
| A/තොරතුරු | | 2018.07 - 26 |

කළමණාකරු,

ට්‍රාන්ස්පේරන්ස් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා,

5/1, එලි බැන්ක් පාර,

බම්බලපිටිය,

කොළඹ 05.

<u>තොරතුරු පනත අනුව තොරතුරු ලබාදීම.</u>

ඔබ විසින් උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ 2018.07.11 දිනැති අභියාචනා අයදුම්පත්‍රය හා බැඳේ. ඒ අනුව ඔබ විසින් ඉල්ලා ඇති පරිදි ප්‍රශ්න අංක 6,7,8,9,10 සහ 11 සම්බන්ධයෙන් තොරතුරු පහත සඳහන් කරමි.

- ප්‍රශ්න අංක 06 : මෙම ප්‍රදේශයේ කසල එකතු කිරීමට කාල සටහනක් නොමැති අතර, දිනපතා කසල එකතු කරනු ලබයි. දිනපතා කසල එකතු කිරීම නිසා ගැටළුවක් ඇති නොවේ.

- ප්‍රශ්න අංක 07 : ප්‍රජාව ශබ්ද විකාශන යන්ත්‍ර මගින් දැනුවත් කර ඇත.එය කොළොන්නාව නගර සභාවේ කාර්යයකි. (අංක 06 සහ 07 ප්‍රශ්න වලට අදාලව වාර්ෂික වැඩ සැලැස්ම මේ සමග අමුණා ඇත.)

- ප්‍රශ්න අංක 08 : පුද්ගලික අංශයට කසල ඇදීම පවරා නොමැති නිසා එම ගැටළු නගර සභාවට අයිති නොවේ.

- ප්‍රශ්න අංක 09 : කසල ඇදීම ගැටළු සහගත වේ නම් ප්‍රදේශවාසීන්ට නගර සභා ආඥා පනතේ 220 වගන්තිය අනුව සභාවට හෝ නිලධරයෙකුට විරුද්ධව නඩු පැවරිය හැකිය.

- ප්‍රශ්න අංක 10 /11 : කසළ එකතු නොකිරීම සම්බන්ධව ලිඛිත පැමිණිලි ලැබී නැත. අපජලය හා පරිසර ගැටළු සම්බන්ධව ඉතා අඩු පැමිණිලි ප්‍රමාණයක් ලැබී ඇත. බොහෝ විට දුරකථනයෙන් කසල නොගත් බවට පැමිණිලි ලදහොත් එම කසල කඩිනමින් ඉවත් කිරීමට කටයුතු කරනු ලබයි. බල ප්‍රදේශයේ දිනපතා කසල එකතු කරනු ලබන එකම පළාත් පාලන ආයතනය කොළොන්නාව නගර සභාවයි.

- උක්ත කරුණු ඔබගේ අවධානයට යොමු කරන අතර කසල වෙන් කර ගැනීම හේතුවෙන් (දිරන නොදිරන ලෙස) වර්තමානයේ ප්‍රජාව අතර ගැටළු මතුව ඇත. කසල වෙන් කර ලබාදීමට නාගරික ප්‍රජාව දැඩි අකමැත්තක් පෙන්නුම් කරයි. නමුත් ගැටළු මැද එම වැඩ සටහන ක්‍රියාත්මක වේ.

මෙම ආයතනය වෙතින් තොරතුරු විමසූ ඔබට ස්තූතිය පළ කරන අතර අවශ්‍ය තොරතුරු නිවැරදිව ඔබ වෙත ලබාදීමට අප කටයුතු කරන බව වැඩිදුරටත් දන්වමි.

ලේකම්,

කොළොන්නාව නගර සභාව.

**එම්. පී. ඩබ්. ආර්. දීප්ති පීරිස්**
ලේකම් (වැ.බ.)
**නගර සභාව - කොලොන්නාව.**

# කොළොන්නාව නගර සභාව - 2018
## කසළ කළමනාකරණය

| වාහන අංකය | සෞඛ්‍ය පරිපාලක | රියදුරු නම | කසළ ගනු ලබන මාර්ගය හා වේලාව |
|---|---|---|---|
| 226 - 2055 | රංජිත් කුමාර රත්නායක | එම්.වයි. පද්මසිරි | 1. කොළොන්නාව ප්‍රධාන පාර (නාගහමුල්ල හංදිය සිට තෙල්සංස්ථාව තෙක්)<br>2. ගුණතිලක පාර<br>3. සමරනායක පාර<br>4. අභය පාර<br>5. කුමාරතුංග මුනිදාස මාවත<br>6. විජේසිංහ මාවත<br>7. උමගිලිය අවට |
| RE - 5378 | කේ.කේ.ඩී. සුදත් | පි.කේ. සුනිල් | 1. අයි.ඩී.එච් පාර<br>2. සිංහපුර<br>3. පුවක්ගහ වත්ත<br>4. කොළොන්නාව පොදු වෙළදසැල<br>5. බදුවත්ත<br>6. සාලමුල්ල<br>7. රණවිරු මාවත - සාලමුල්ල |
| RC - 3053 | කේ.කේ.ඩී සුදත් | පි.සෙල්වරාජ් | 1. සුදුනෙළුම්පුර<br>2. විජයපාර |

| | | | |
|---|---|---|---|
| | | | 3. ගාමිණී පාර<br>4. ලක්සඳ සෙවණ<br>5. ගමගේ වත්ත<br>6. ආනන්දාරාම පාර<br>7. සාලමුල්ල ක්‍රීඩාංගණය |
| 226 - 2069 | ඩබ්.ඒ. පාලිත | සුරංග බාලසූරිය | 1. ඔරුගොඩවත්ත ප්‍රධාන පාර<br>2. මජිඩ් පෙදෙස<br>3. 13 වත්ත<br>4. 15 වත්ත<br>5. සාතම්මා වත්ත<br>6. රේල් ගේට්ටුව අසල<br>7. කර්මාන්තපුරය<br>8. රේගුව<br>9. ලූකස් පාර<br>10. 31 වත්ත<br>11. යුනයිටඩ් මෝටර්ස් |
| 226-2057 | රොෂාන් විජේසූරිය | අශෝක වීරසිංහ | 1. පැරකුම්බා මාවත<br>2. ගජබාපුර නිවාස සංකීර්ණය<br>3. විජය පාර<br>4. කැප්පටිපොල මාවත |

| | | | |
|---|---|---|---|
| | | | 5. රණසිංහ මාවත<br>6. පිරිවෙන පාර<br>7. ටෙරන්ස් ද සිල්වා මාවත<br>8. විජය පටුමග |
| RD - 2773 | ඒ.පී.ආර්. ධර්මතිලක | පි.එස්. බණ්ඩාර | 1. විහාර මාවත<br>2. නාගහමුල්ල පාර<br>3. 101 වත්ත<br>4. දහම්පුර<br>5. පන්සල්හේන<br>6. නාගහමුල්ල පටුමග<br>7. සුගුණසාර පාර<br>8. ඥාණසිරි මාවත<br>9. බාලිකාව අසල පාර |
| RB -2294 | බෙනඩික් රාජරත්න | එම්.ඒ. ධනුෂ්ක | 1. උමගිලිය වත්ත<br>2. කීර කොටුව පාර<br>3. අඹතලේ පාර කොටසක්<br>4. නවලෝකපුර<br>5. සිරිපාලපිංතු මාවත<br>6. අබාන්ස් වත්ත |

| | | | |
|---|---|---|---|
| RD - 8068 | බෙනඩික් රාජරත්න | නලින් ප්‍රසන්න | 1. වෙහෙරගොඩැල්ල<br>2. කම්බිකොටුව පාර<br>3. අඹතලේ පාර කොටසක්<br>4. තුඩුගල මාවත<br>5. දෙවොල් මඩු වත්ත<br>6. බේකරි වත්ත<br>7. 82 වත්ත |
| RE - 7556 | ඊ.ජේ.ඒ චමිල | පි.එච්. නීලරත්න | 1. මීතොටමුල්ල ප්‍රධාන පාර<br>2. ආබෘ පෙදෙස<br>3. මීතොටමුල්ල පටුමග<br>4. සි.ජී.ආර් ඉඩම පාර<br>5. දේවාල පාර<br>6. කලංසූරිය පටුමග<br>7. නේවි පිට්ටනිය අසල<br>8. රේල් පාර |
| RC - 3057 | ඊ.ජේ.ඒ චමිල් | කේ.වී. වසන්ත | 1. වඩුගොඩවත්ත<br>2. සිල්වා පටුමග<br>3. පෙරේරා මාවත |
| RE - 5380 | පි.එච්. ආරියවංශ | ඉන්දික සුදේශ් | 1. කුරුණියාවත්ත පළමු අදියර<br>2. කුරුණියාවත්ත දෙවන අදියර |

| | | | |
|---|---|---|---|
| | | | 3. සංඝබෝධි මාවත<br>4. දොස්තරවත්ත පාර<br>5. කුමාරදාස පෙදෙස<br>6. අවිස්සාවේල්ල ප්‍රධාන පාර<br>7. කළංසූරිය වත්ත<br>8. රේල් ගේට්ටුව අසල |
| RD – 1602 | පි.එච්. ආරියවංශ | එච්.ඒ. අනුර | 1. වැල්ලම්පිටිය වෙළද සංකීර්ණය<br>2. සාලවත්ත පාර<br>3. විමලාරාම පාර<br>4. විමලාරාම පටුමග<br>5. නාගහමුල්ල හංදියේ සිට පොලිසිය තෙක්<br>6. සාලවත්ත පටුමග<br>7. කුමාරදාස පෙදෙස |
| RD - 1602 | ඩබ්.ඒ.පාලිත | සංජීව ප්‍රියන්ත | 1. නවගම්පුර<br>2. බේස්ලයින් පාර<br>3. වදුල්ලවත්ත<br>4. නවකැළණිපුර |

කොළොන්නාව නගර සීමාව සෞඛ්‍යමත් හා ගුණාත්මක නගරයක් කිරීමට නාගරික ප්‍රජාව වශයෙන් කසළ වෙන් කිරීමට ඔබගේ අතිමහත් දායකත්වය ලබා දෙන්න....

*ඔබ කලයුත්තේ ඔබගේ කසළ පහත අයුරින් වෙන් කරදීමයි.*

| දිරන කසළ | ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ | ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි කසළ |
|---|---|---|
| [illegible] අපද්‍රව්‍ය නිපදවන ඔබගේ නිවස තුල/ ආයතනය තුල මෙම අපද්‍රව්‍ය කොම්පෝස්ට් කිරීම සඳහා ද කුඩා ඉඩක් තබා ගන්න<br><br>➢ මුළුතැන්ගෙයි ඉවතලන අපද්‍රව්‍ය<br>ඉවතලන එළවළු<br>පළතුරු කොටස්<br>ඉවතලන කෑම වර්ග<br>පොල් කුඩු<br>[illegible]ත් කුඩු<br>බිත්තර කටු | ➢ වීදුරු<br>➢ කඩදාසි/ කාඩ්බෝඩ්<br>➢ පිරිසිදු පොලිතීන්/ ප්ලාස්ටික්<br>➢ ලෝහ වර්ග<br>➢ පොල් කටු<br>➢ පිරිසිදු කරන ලද ටින් වර්ග<br>➢ පිරිසිදු කරන ලද යෝගට් කෝප්ප වැනි ප්ලාස්ටික් කෝප්ප වර්ග<br>➢ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි මුළුතැන්ගෙයි උපකරණ | ➢ අපිරිසිදු පොලිතීන්/ කඩදාසි<br>➢ සනීපාරක්ෂක පැළඳුම්<br>➢ අපිරිසිදු යෝගට් කෝප්ප වැනි දෑ<br>➢ කිරි පැකට්<br>➢ ෂැම්පූ පැකට්/ සෝස් පැකට්/ මයිලෝ පැකට් වැනි දෑ<br>➢ ඉවතලන හිසකෙස්, රෙදි හා සපත්තු<br>➢ තලය සහිත රේසර්<br>➢ අපිරිසිදු ටින්<br>➢ බෙහෙත් ද්‍රව්‍ය<br>➢ රබර්<br>➢ මැටි පෝච්චි<br>➢ පිඟන් මැටි භාණ්ඩ |

සතියේ සෑම දිනකම වෙන් වෙන් වශයෙන් කසළ භාරගනු ලැබේ. සේවකයින් නිවාඩු දිනවල සහ වාහන වල අඩුපාඩු ඇති උවහොත් මෙම තත්වය තාවකාලිකව වෙනස්විය හැකි බව කාරුණිකව දන්වමි.

**- කොළොන්නාව නගර සභාව -**

දුරකතන අංකය:- 0112572329